# සතිපතා ආර්ථික දර්ශක



## 2023 නොවැම්බර් 03

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

# සතියේ සුවිශේෂී කරුණු

## මූර්ත අංශය

කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, 2023 සැප්තැම්බර් මාසයේ වාර්තා වූ සියයට 1.3හි සිට 2023 ඔක්තෝබර් මාසයේ දී සියයට 1.5 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. තවද, අඛණ්ඩව සිව්වන වරටත් ආහාර අවධමනයක් වාර්තා වූ අතර, එය සියයට 5.2ක් විය. මේ අතර, ආහාර නොවන උද්ධමනය සියයට 4.9ක් ලෙස වාර්තා විය. තවද, කො.පා.මි.ද. මත පදනම් වූ මූලික උද්ධමනය, 2023 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 1.9හි සිට ඔක්තෝබර් මාසයේ දී සියයට 1.2 දක්වා පහළ ගියේය.

2023 සැප්තැම්බර් මාසයේ දී, පෙර මාසයට සාපේක්ෂව ඉදිකිරීම් කටයුතුවල පවතින දුර්වල ක්‍රියාකාරීත්වය තවදුරටත් පෙන්නුම් කරමින්, ඉදිකිරීම් ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය 44.3ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

සලකා බලන කාලපරිච්ඡේදය (2023.10.28 සිට 2023.11.03 දක්වා කාලය) තුළ දී බොරතෙල් මිල ගණන් පහළ යෑමේ ප්‍රවණතාවක් බොහෝ දුරට පෙන්නුම් කළේය. භූ දේශපාලන අවදානම් හේතුවෙන් බොරතෙල් සැපයුම අඩාල වීම පිළිබඳ පැවති අවිනිශ්චිතතා ලිහිල් වීම, එක්සත් ජනපද හා ඔපෙක් බොරතෙල් නිෂ්පාදනය ඉහළ යෑම සහ ඩොලරය ශක්තිමත් වීම හේතුවෙන් මිල ගණන් පහළ ගියේ ය. කෙසේ වෙතත්, එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව සහ එංගලන්ත මහ බැංකුව සිය පදනම් පොලී අනුපාත නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කිරීම හේතුවෙන් කාල පරිච්ඡේදය අවසානයේ දී මිල ගණන් ඉහළ ගියේ ය. සමස්තයක් ලෙස, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි බොරතෙල් බැරලයක මිල ගණන්, පිළිවෙළින්, එක්සත් ජනපද ඩොලර් 3.08න් සහ එක්සත් ජනපද ඩොලර් 2.35කින් පහළ ගියේය.

## මුදල් අංශය

සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය පෙර සතිය හා සැසඳීමේ දී 2023 නොවැම්බර් මස 03 වන දිනෙන් අවසාන වන සතිය සඳහා පදනම් අංක 02කින් සියයට 13.88ක් දක්වා ඉහළ ගියේය.

2023 සැප්තැම්බර් මාසයේ දී පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය සියයට 6.3ක් විය.
2023 සැප්තැම්බර් මාසයේ දී බැංකු පද්ධතිය මගින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය රුපියල් බිලියන 261.6කින් පහළ ගියේය.
රාජ්‍ය සංස්ථා වෙත සපයන ලද සමස්ත ණය ප්‍රමාණය 2023 සැප්තැම්බර් මාසයේ දී රුපියල් බිලියන 7.8කින් ඉහළ ගියේය.
පෞද්ගලික අංශය වෙත සපයන ලද සමස්ත ණය ප්‍රමාණය 2023 සැප්තැම්බර් මාසයේ දී රුපියල් බිලියන 69.7කින් ඉහළ ගියේය.

වාණිජ බැංකු සතු තැන්පතු ප්‍රමාණය ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන පසුගිය සතියට සාපේක්ෂව සංචිත මුදල් ඉහළ යන ලදී.

සමස්ත වෙළෙඳපොළ ද්‍රවශීලතාව පෙර සතියේ අග පැවති රුපියල් බිලියන 15.334ක අතිරික්තයට සාපේක්ෂව මෙම සතියේ දී රුපියල් බිලියන 35.508ක අතිරික්තයක් විය.

පසුගිය සතිය හා සැසඳීමේ දී 2023 නොවැම්බර් මස 03 දින වන විට, සමස්ත කොටස් මිල දර්ශකය සියයට 0.94කින් දර්ශක අගය 10,789.87ක් දක්වා ඉහළ ගිය අතර, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය සියයට 0.53කින් දර්ශක අගය 3,031.28ක් දක්වා ඉහළ ගියේය.

## රාජ්‍ය මූල්‍ය අංශය

මෙම සතිය තුළ දී, භාණ්ඩාගාර බිල්පත්හි ප්‍රාථමික සහ ද්විතීයික වෙළෙඳපොළ ඵලදා අනුපාතිකවල සුළු පහත වැටීමක් පෙන්නුම් කළ අතර, ද්විතීයික වෙළෙඳපොළ භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාතික ඉහළ යන ලදී.

පසුගිය සතියට සාපේක්ෂව, මෙම සතිය තුළ දී අනේවාසිකයන් සතු නොපියවූ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණයෙහි රුපියල් අගය සියයට 1.25ක අඩුවීමක් පෙන්නුම් කර ඇත.

මෙම සතිය තුළ දී පවත්වන ලද භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිය සඳහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය ඉදිරිපත් කළ මුළු ප්‍රමාණය මෙන් 1.92 ගුණයකි.

පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළ දී භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මුළු ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනු ප්‍රමාණය සියයට 9.77ක ප්‍රතිශතයකින් ඉහළ යාමක් දක්නට ලැබේ.

## විදේශීය අංශය

2023 වසරේ නොවැම්බර් 03 වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව සියයට 10.3කින් අතිප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල් ඒකකවල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල, ජපන් යෙන්වලට සාපේක්ෂව සියයට 25.2කින්, ස්ටර්ලිං පවුමට සාපේක්ෂව සියයට 8.9කින්, යූරෝවලට සාපේක්ෂව සියයට 10.6කින් සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව සියයට 10.9කින් අතිප්‍රමාණය විය.

2023 වසරේ සැප්තැම්බර් මස අවසානයට දළ නිල සංචිත ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් මිලියන 3,540ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. එක්සත් ජනපද ඩොලර් බිලියන 1.3කට පමණ සමාන වූ චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකමෙහි ලැබීම් මෙහි අන්තර්ගත වන අතර, එය භාවිතා කිරීමේ කොන්දේසි වලට යටත් වේ.

2023 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එක්සත් ජනපද ඩොලර් මිලියන 8,982ක් දක්වා සියයට 10.1කින් පහළ ගිය අතර, මේ සඳහා රෙදිපිළි හා ඇඟලුම් (-19.4%), රබර් නිෂ්පාදිත (-11.5%), ඛනිජ තෙල් නිෂ්පාදිත (-15.6%), පොල් ආශ්‍රිත නිෂ්පාදිත (-18.3%) සහ රසායනික නිෂ්පාදිත (-16.8%) අපනයන ආදායම පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. 2023 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එක්සත් ජනපද ඩොලර් මිලියන 12,323ක් දක්වා සියයට 12.5කින් පහළ ගිය අතර, ප්‍රධාන වශයෙන්, රෙදිපිළි හා රෙදිපිළි උපාංග (-26.9%), ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (-69.8%), ඉන්ධන (-5.9%) යන්ත්‍රසූත්‍ර හා උපකරණ (-13.7%), සහ ගොඩනැගිලි ද්‍රව්‍ය (-26.%) ආනයන පහළ යෑම මේ සඳහා හේතු විය. ඒ අනුව, 2023 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී වෙළඳ හිඟය, 2022 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ එක්සත් ජනපද ඩොලර් මිලියන 4,093ක සිට එක්සත් ජනපද ඩොලර් මිලියන 3,342ක් දක්වා සැලකිය යුතු ලෙස පහළ ගියේය.

කාර්මික භාණ්ඩ අපනයන මිල ගණන් පහළ යෑම හේතුවෙන් 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී අපනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 18.7කින් පහළ ගියේය. 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී ආනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 14.4කින් පහළ ගිය අතර, මේ සඳහා අන්තර් හා ආයෝජන භාණ්ඩ කාණ්ඩ යටතේ ආනයන මිල ගණන් පහළ යෑම හේතු විය. මේ අනුව, 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී වෙළඳ මිල අනුපාතය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව දර්ශකාංක 87.2ක් දක්වා සියයට 5.1කින් පහළ ගියේය.

තේ සඳහා වෙන්දේසි මිලෙහි සාමාන්‍යය (කොළඹ තේ වෙන්දේසියෙහි මිල) 2022 වසරේ සැප්තැම්බර් මාසයේ පැවති කිලෝග්‍රෑමයට එක්සත් ජනපද ඩොලර් 4.48 සිට 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී කිලෝග්‍රෑමයට එක්සත් ජනපද ඩොලර් 3.63ක් දක්වා පහළ ගියේය.


# මූර්ත අංශය

## 1.1 මිල දර්ශක


| ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) (2021=100) | 2022 සැප්. | 2023 අගෝ. | 2023 සැප්. |
|---|---|---|---|
| මතුපිට උද්ධමනය - ( ජා. පා. මි. ද. ) | 201.9 | 201.9 | 203.5 |
| මාසික ප්‍රතිශත වෙනස % | 2.1 | 0.0 | 0.8 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | - | - |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | - | 2.1 | 0.8 |
| මූලික උද්ධමනය - ( ජා. පා. මි. ද. ) | 185.9 | 188.7 | 189.0 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | - | - |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | - | 4.1 | 1.7 |

| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) (2021=100) | 2022 ඔක්. | 2023 සැප්. | 2023 ඔක්. |
|---|---|---|---|
| මතුපිට උද්ධමනය - ( කො. පා. මි. ද. ) | 188.5 | 191.8 | 191.4 |
| මාසික ප්‍රතිශත වෙනස % | (0.4) | 0.9 | (0.2) |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | - | - |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | - | 1.3 | 1.5 |
| මූලික උද්ධමනය - ( කො. පා. මි. ද. ) | 170.4 | 172.0 | 172.4 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | - | - |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | - | 1.9 | 1.2 |

ජා.පා.මි.ද. ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස




කො.පා.මි.ද. ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.2 මිල

### 1.2.1 පිටකොටුව වෙළඳපොළ

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය - පසුගිය වසර | තොග - පසුගිය මාසය | තොග - පසුගිය සතිය | තොග - මෙම සතිය | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය - පසුගිය වසර | සිල්ලර - පසුගිය මාසය | සිල්ලර - පසුගිය සතිය | සිල්ලර - මෙම සතිය |
|---|---|---|---|---|---|---|---|---|
| සම්බා | 222.20 | 220.00 | 223.40 | 223.40 | 230.00 | 230.00 | 236.00 | 230.00 |
| රතු කැකුළු | 212.00 | 175.00 | 173.80 | 177.00 | 220.00 | 190.00 | 199.00 | 205.00 |
| බෝංචි | 380.00 | 330.00 | 610.00 | 440.00 | 430.00 | 380.00 | 660.00 | 490.00 |
| ගෝවා | 216.00 | 72.00 | 100.00 | 220.00 | 260.00 | 124.00 | 150.00 | 270.00 |
| කැරට් | 320.00 | 138.00 | 206.00 | 228.00 | 370.00 | 184.00 | 256.00 | 278.00 |
| තක්කාලි | 350.00 | 140.00 | 150.00 | 138.00 | 400.00 | 180.00 | 200.00 | 178.00 |
| වට්ටක්කා | 130.00 | 56.00 | 50.00 | 77.00 | 160.00 | 116.00 | 100.00 | 120.00 |
| පතෝල | 284.00 | 200.00 | 314.00 | 326.00 | 332.00 | 240.00 | 370.00 | 378.00 |
| වම්බටු | 300.00 | 318.00 | 360.00 | 318.00 | 350.00 | 364.00 | 410.00 | 368.00 |
| අමු මිරිස් | 212.00 | 410.00 | 350.00 | 390.00 | 272.00 | 460.00 | 400.00 | 440.00 |
| දෙහි | 390.00 | 1,060.00 | 1,200.00 | 1,280.00 | 440.00 | 1,260.00 | 1,370.00 | 1,600.00 |
| රතු ළූණු ( දේශීය) | 576.80 | 306.20 | 361.80 | 429.20 | ලැනො. | 350.00 | 408.00 | 500.00 |
| ලොකු ළූණු ( ආනයනික) | 234.00 | 222.00 | 230.80 | 257.60 | 260.00 | 234.60 | 252.00 | 320.00 |
| අර්තාපල් ( දේශීය) | 324.20 | 234.20 | 229.00 | 229.00 | 368.00 | 300.00 | 248.00 | 258.00 |
| වියළි මිරිස් ( ආනයනික) | 1,523.40 | 1,033.00 | 1,033.00 | 1,036.40 | 1,610.00 | 1,150.00 | 1,168.00 | 1,150.00 |
| රතු පරිප්පු | 384.20 | 297.00 | 296.00 | 293.00 | 400.00 | 324.00 | 316.00 | 310.00 |
| බිත්තර-සුදු ( ඒකක මිල) | 48.80 | 46.00 | 44.20 | 43.40 | 49.80 | 46.50 | 44.70 | 43.90 |
| පොල් ( ගෙඩියක මිල) | 85.00 | 85.00 | 85.00 | 85.00 | 90.00 | 120.00 | 120.00 | 120.00 |

### 1.2.2 මරදගහමුල සහල් මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සහල් තොග මිල ගණන්හි සාමාන්‍යය - පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය |
|---|---|---|---|---|
| සම්බා | 212.80 | 213.00 | 219.80 | 221.20 |
| සුදු කැකුළු | 194.00 | 187.00 | 187.60 | 188.80 |
| රතු කැකුළු | 208.00 | 176.60 | 175.00 | 175.00 |
| නාඩු | 202.00 | 193.40 | 199.40 | 200.80 |

ලැනො. - ලැබී නොමැත.
(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කර ඇත.


## 1.2.3 දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය


| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | 229.00 | 229.00 |
| රතු කැකුළු | 180.00 | 180.00 |
| බෝංචි | 511.00 | 350.00 |
| ගෝවා | 116.00 | 150.00 |
| කැරට් | 202.00 | 244.00 |
| තක්කාලි | 89.00 | 100.00 |
| වට්ටක්කා | 49.80 | 60.60 |
| පතෝල | 183.00 | 221.00 |
| වම්බටු | 236.00 | 245.00 |
| අළු කෙසෙල් | 217.00 | 226.00 |
| රතු ළූණු ( දේශීය) | 338.00 | 370.00 |
| රතු ළූණු ( ආනයනික) | 275.00 | ලැනො. |
| ලොකු ළූණු ( ආනයනික) | 244.60 | 255.00 |
| අර්තාපල් (දේශීය) | 202.75 | 206.25 |
| අර්තාපල් ( ආනයනික) | 155.40 | 150.60 |
| වියළි මිරිස් ( ආනයනික) | 1,033.00 | 1,031.00 |
| පොල් ( ගෙඩියක මිල) | 76.00 | 76.40 |


## 1.2.4 නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය


| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | 230.00 | 230.00 |
| රතු කැකුළු | 188.00 | 191.00 |
| බෝංචි | 588.00 | 620.00 |
| ගෝවා | 256.00 | 356.00 |
| කැරට් | 332.00 | 400.00 |
| තක්කාලි | 280.00 | 256.00 |
| වට්ටක්කා | 108.00 | 118.00 |
| පතෝල | 408.00 | 424.00 |
| වම්බටු | 456.00 | 528.00 |
| අමු මිරිස් | 640.00 | 720.00 |
| රතු ළූණු ( දේශීය) | 480.00 | 480.00 |
| ලොකු ළූණු ( ආනයනික) | 252.00 | 300.00 |
| අර්තාපල් ( දේශීය) | 320.00 | 344.00 |
| අර්තාපල් ( ආනයනික) | 200.00 | 200.00 |
| වියළි මිරිස් ( ආනයනික) | 1,200.00 | 1,120.00 |
| රතු පරිප්පු | 328.00 | 320.00 |
| සුදු සීනි | 266.00 | 276.00 |
| බිත්තර- සුදු ( එකක මිල) | 45.80 | 45.00 |
| පොල් ( ගෙඩියක මිල) | 110.00 | 110.00 |


### නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය - සිල්ලර මිල




## 1.2.5 මාළු වෙළඳපොළ

| | පෑලියගොඩ | | මීගමුව | | | | නාරාහේන්පිට | |
|---|---|---|---|---|---|---|---|---|
| | තොග මිල ගණන්හි සාමාන්‍යය | | තොග මිල ගණන්හි සාමාන්‍යය | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
| | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය |
| කෙලවල්ලා | 980.00 | 970.00 | 1,050.00 | 1,030.00 | 1,560.00 | 1,532.00 | 1,896.00 | 2,136.00 |
| බලයා | 560.00 | 500.00 | 700.00 | 680.00 | 890.00 | 860.00 | 832.00 | 796.00 |
| සාලයා | 194.00 | 210.00 | 262.00 | 238.00 | 390.00 | 386.00 | 328.00 | 332.00 |
| හුරුල්ලා | 320.00 | 460.00 | 377.50 | 442.50 | 527.50 | 622.50 | 525.00 | 664.00 |


ලැනො. - ලැබී නොමැත.

## 1.3 කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2015 ස්ථාවර මිල අනුව) - එකතු කළ අගය මත වර්ධන අනුපාතිකය

| අයිතමය | වාර්ෂික | | දෙවන කාර්තුව | |
|---|---|---|---|---|
| | 2021 (ආ)(ආ) | 2022 (ආ) | 2022(ආ)(ආ) | 2023 (ආ) |
| කෘෂිකාර්මික | 0.9 | (4.6) | (7.9) | 3.6 |
| කාර්මික | 5.7 | (16.0) | (10.1) | (11.5) |
| සේවා | 3.5 | (2.0) | (1.8) | (0.8) |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු -සහනාධාර | (3.6) | (27.1) | (40.6) | 12.6 |
| දළ දේශීය නිෂ්පාදිතය | 3.5 | (7.8) | (7.4) | (3.1) |

(ආ) සංශෝධිත
(ආ) තාවකාලික

මූර්ත දළ දේශීය නිෂ්පාදිතය





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.4 කෘෂිකාර්මික නිෂ්පාදනය

| අයිතමය | අගෝස්තු | | % වෙනස |
|---|---|---|---|
| | 2022 (අ) | 2023 (අ) | |
| තේ (කි.ග්‍රෑ. මිලියන) | 18.3 | 18.3 | -0.4 |
| රබර් (කි.ග්‍රෑ. මිලියන) | 6.5 | 6.0 | -8.1 |
| පොල් (ගෙඩි මිලියන) | 296.4 | 275.9 | (6.9) |

(අ) තාවකාලික

තේ නිෂ්පාදනය





මූලයන්: ශ්‍රී ලංකා තේ මණ්ඩලය
රබර් සංවර්ධන මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය

## 1.5 කාර්මික නිෂ්පාදන දර්ශකය (කා.නි.ද) (2015=100) (අ)

| අයිතමය | අගෝස්තු | | % වෙනස |
|---|---|---|---|
| | 2022 (ආ) | 2023 (ආ) | |
| කාර්මික නිෂ්පාදන දර්ශකය | 90.7 | 90.2 | (0.6) |
| ආහාර නිෂ්පාදන | 93.7 | 94.5 | 0.8 |
| ඇඟලුම් නිෂ්පාදන | 98.7 | 70.1 | (28.9) |
| අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන | 121.7 | 107.2 | (11.9) |
| පිරිපහදුකළ ඛනිජතෙල් නිෂ්පාදන | 31.7 | 113.8 | 259.1 |
| රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 95.6 | 82.6 | (13.6) |
| රසායනික ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන | 98.0 | 72.2 | (26.3) |
| පාන වර්ග | 129.6 | 129.7 | 0.1 |

(අ) ප්‍රධාන උප අංශ 7
(ආ) සංශෝධිත
(ආ) තාවකාලික

කාර්මික නිෂ්පාදන දර්ශකය





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.6 ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය


| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - නිෂ්පාදන | 2022 | | 2023 | |
|---|---|---|---|---|
| | අගෝ | සැප්. | අගෝ | සැප්. |
| දර්ශකය | 49.6 | 42.6 | 49.3 | 45.7 |

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - නිෂ්පාදන





| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - සේවා | 2022 | | 2023 | |
|---|---|---|---|---|
| | අගෝ | සැප්. | අගෝ | සැප්. |
| දර්ශකය | 51.7 | 51.2 | 57.6 | 54.7 |

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - සේවා




| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - ඉදිකිරීම් | 2022 | | 2023 | |
|---|---|---|---|---|
| | අගෝ | සැප්. | අගෝ | සැප්. |
| සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය | 32.9 | 44.6 | 47.0 | 44.3 |

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - ඉදිකිරීම්




## 1.7 සේවා නියුක්තිය (අ)

| අයිතමය | 2022 | 2023 කාර්තු:1 | 2023 කාර්තු:2 |
|---|---|---|---|
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය | 49.8 | 49.9 | 48.6 |
| සේවා වියුක්ති අනුපාතිකය | 4.7 | 4.7 | 5.2 |

**අංශය අනුව සේවා නියුක්ත පුද්ගලයන්(ආ) (මුළු සේවා නියුක්තියෙන් ප්‍රතිශතයක් ලෙස)**


| | 2022 | 2022 කාර්තු:4 | 2023 කාර්තු:1 |
|---|---|---|---|
| කෘෂිකර්මාන්ත | 26.5 | 28.2 | 26.7 |
| කර්මාන්ත | 26.5 | 24.3 | 25.5 |
| සේවා | 47.0 | 47.5 | 47.8 |




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.8 වැටුප් ප්‍රමාණ දර්ශක


| අයිතමය | 2022 සැප්. | 2023 සැප්. | වෙනස % |
|---|---|---|---|
| රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016 = 100) - නාමික | 133.1 | 133.1 | 0.0 |
| අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018 = 100) - නාමික | 161.0 | 172.0 | 6.8 |
| කෘෂිකර්මාන්ත | 162.1 | 171.3 | 5.7 |
| කර්මාන්ත | 160.6 | 172.0 | 7.1 |
| සේවා | 160.5 | 172.9 | 7.7 |





## 1.9 බොරතෙල් සාමාන්‍ය මිල

| මාසය | 2022 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) බ්‍රෙන්ට් (පාදක මිල) | 2022 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | 2022 ලං.ඛ.නී.සං. ආනයන මිල (මි.ර.ගැ.) (බැරලයක් එ.ජ. ඩොලර්) (ඇ) (ඈ) | 2023 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) බ්‍රෙන්ට් (පාදක මිල) | 2023 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | 2023 ලං.ඛ.නී.සං. ආනයන මිල (මි.ර.ගැ.) (බැරලයක් එ.ජ. ඩොලර්) (ඇ) (ඈ) |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 84.96 | 82.55 | 84.09 | 84.28 | 78.60 | 97.93 |
| පෙබරවාරි | 94.17 | 91.74 | 76.41 | 83.52 | 76.97 | - |
| මාර්තු | 114.05 | 109.66 | - | 78.93 | 73.05 | 84.05 |
| අප්‍රේල් | 105.56 | 101.23 | - | 83.09 | 79.10 | 90.49 |
| මැයි | 111.91 | 109.64 | 109.94 | 76.05 | 72.05 | 86.90 |
| ජූනි | 117.29 | 113.89 | - | 74.85 | 70.13 | 90.90 |
| ජූලි | 105.39 | 100.47 | - | 79.90 | 75.52 | 81.29 |
| අගෝස්තු | 98.07 | 91.79 | 114.71 | 85.09 | 81.28 | 81.53 |
| සැප්තැම්බර් | 91.03 | 84.58 | 119.71 | 91.89 | 88.72 | - |
| ඔක්තෝබර් | 93.04 | 86.60 | - | 89.19 | 86.16 | |
| නොවැම්බර් | 90.89 | 83.96 | 98.77 | | | |
| දෙසැම්බර් | 81.80 | 77.06 | 97.03 | | | |

| දිනය | 2022 | | 2023 | |
|---|---|---|---|---|
| 28-10 | 96.63 | 88.61 | - | - |
| 29-10 | - | - | - | - |
| 30-10 | - | - | 89.83 | 84.79 |
| 31-10 | 95.95 | 88.18 | 88.14 | 82.86 |
| 01-11 | 94.83 | 86.67 | 87.41 | 81.29 |
| 02-11 | 95.38 | 89.25 | 85.36 | 81.19 |
| 03-11 | 95.62 | 89.31 | 86.75 | 82.44 |





මූලයන්: බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

## 1.10 දෛනික විදුලිබල උත්පාදනය

| | 2023-10-30 | 2023-10-31 | 2023-11-01 | 2023-11-02 |
|---|---|---|---|---|
| උපරිම ඉල්ලුම (මෙ. වො.) | 1,930.30 | 1,953.80 | 1,995.20 | 2,095.00 |
| මුළු උත්පාදනය (ගි. වො. පැ) | 40.82 | 41.68 | 41.41 | 41.85 |
| ජල | 25.36 | 26.94 | 27.69 | 28.11 |
| ගල් අඟුරු | 11.35 | 10.76 | 10.58 | 10.48 |
| තෙල් | 0.92 | 0.21 | 0.35 | 0.66 |
| සුළං | 0.32 | 0.87 | 0.31 | 0.17 |
| සූර්ය (තොග) | 2.51 | 2.55 | 2.22 | 2.17 |
| ජෛව ස්කන්ධය | 0.35 | 0.36 | 0.27 | 0.25 |




මූලය: ලංකා විදුලිබල මණ්ඩලය


(අ) කුටුම්භ ජනගහනය අවුරුදු 15 සහ ඊට වැඩි
(ආ) ජාත්‍යන්තර ප්‍රමිති වර්ගීකරණ 4 වන සංශෝධනය මත පදනම් වේ.
(ඇ) ලං.ඛ.නී.සං. ආනයන මිල ගණන්වලට ගැල් කුලී ඇතුළත් වීම සහ එය විවිධ බොරතෙල් වර්ගවල සාමාන්‍ය මිල ගණන් අනුව බර තබන ලද මිලක් වන බැවින් ලං.ඛ.නී.සං. ආනයන මිල, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි. ඉදිරි වෙළඳපොළ මිල ගණන් සමඟ සෘජුව සැසඳිය නොහැකිය. එසේම, ලං.ඛ.නී.සං. ආනයනවලින් කොටසක් කාලීන ගිවිසුම් මත පදනම් වේ. 2022 වසරේ මාර්තු, අප්‍රේල්, ජූනි, ජූලි ඔක්තෝබර් සහ 2023 වසරේ පෙබරවාරි සහ සැප්තැම්බර් යන මාසවල දී බොරතෙල් ආනයනය කර නැත.
(ඈ) තාවකාලික

# මුදල් අංශය

## 2.1 පොලී අනුපාතික (වාර්ෂික අනුපාතය ප්‍රතිශතයක් ලෙස)

| ප්‍රතිපත්ති පොලී අනුපාතික | වසරකට පෙර | සතියකට පෙර | මෙම සතිය |
|---|---|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 14.50 | 10.00 | 10.00 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 15.50 | 11.00 | 11.00 |
| **ඒක්ෂණ මුදල් වෙළඳපොළ** | | | |
| බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) (සතිපතා සාමාන්‍යය) | 15.50 | 10.31 | 10.27 |
| **භාණ්ඩාගාර බිල්පත් එලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | |
| දින 91 | 33.10 | 16.10 | 15.93 |
| දින 182 | 32.53 | 14.93 | 14.93 |
| දින 364 | 29.57 | 13.02 | 13.02 |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු** | | | |
| බරිත සාමාන්‍යය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR) | 26.56 | 13.86 | 13.88 |

බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (සතිපතා සාමාන්‍යය)




| | 2022 සැප්තැම්බර් | 2023 අගෝස්තු | 2023 සැප්තැම්බර් |
|---|---|---|---|
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.25 - 7.00 | 0.25 - 12.00 | 0.25 - 12.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 3.50 - 28.00 | 1.00 - 24.80 | 1.00 - 24.80 |

| | 2022 ඔක්තෝබර් | 2023 සැප්තැම්බර් | 2023 ඔක්තෝබර් |
|---|---|---|---|
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 12.60 | 13.39 | 12.75 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 16.66 | 17.24 | 16.34 |

| | 2022 සැප්තැම්බර් | 2023 අගෝස්තු | 2023 සැප්තැම්බර් |
|---|---|---|---|
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 22.06 | 11.46 | 11.47 |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 22.55 | 11.81 | 11.82 |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR) | 17.58 | 16.20 | 15.62 |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය (AWNLR) | 24.93 | 17.89 | 16.57 |
| **ජාතික ඉතිරිකිරීමේ බැංකුව** | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 3.00 | 3.00 | 3.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 12.00 | 10.00 | 9.00 |


| භාණ්ඩාර බැඳුම්කර වෙන්දේසිය | වසර 04 මාස 05 2023 ඔක්. 30 | වසර 07 මාස 05 2023 ඔක්. 30 |
|---|---|---|
| පොලී අනුපාතිකය | 10.75 | 11.25 |
| බර තබන ලද සාමාන්‍ය එලදා අනුපාතිකය | - | - |


### බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව


| | සතියකට පෙර | මෙම සතිය | | සතියකට පෙර | මෙම සතිය |
|---|---|---|---|---|---|
| ලංකා බැංකුව | 16.08 | 14.67 | කාර්ගිල්ස් බැංකුව | 13.96 | 14.64 |
| මහජන බැංකුව | 16.22 | 13.51 | එච්එස්බීසී බැංකුව | 13.87 | 13.73 |
| හැටන් නැෂනල් බැංකුව | 13.48 | 13.73 | ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව | 11.41 | 12.63 |
| කොමර්ෂල් බැංකුව | 13.44 | 13.42 | සිටි බැංකුව | 14.50 | 12.75 |
| සම්පත් බැංකුව | 14.54 | 14.07 | ඩොයිෂ් බැංකුව | 13.42 | 13.61 |
| සෙලාන් බැංකුව | 14.75 | 15.70 | හබීබ් බැංකුව | 15.79 | 17.46 |
| යූනියන් බැංකුව | 14.45 | 13.63 | ඉන්දියන් බැංකුව | 15.96 | 15.96 |
| පෑන් ඒෂියා බැංකුව | 14.29 | 14.63 | ඉන්දියන් ඕවර්සීස් බැංකුව | 15.46 | 15.46 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 13.68 | 13.76 | එම්සීබී බැංකුව | 13.65 | 14.00 |
| ඩීඑෆ්සීසී බැංකුව | 15.48 | 15.48 | ඉන්දීය රාජ්‍ය බැංකුව | 16.02 | 14.67 |
| එන්ඩීබී බැංකුව | 14.80 | 14.80 | පබ්ලික් බැංකුව | 17.47 | 20.08 |
| අමානා බැංකුව | 14.43 | 13.11 | බැන්ක් ඔෆ් චයිනා | - | - |

## 2.2 මුදල් සැපයුම

| | රු. බිලියන | | | වාර්ෂික වෙනස (%) | | |
|---|---|---|---|---|---|---|
| | සැප්තැම්බර් 2022 | අගෝස්තු 2023 | සැප්තැම්බර් 2023(අ) | සැප්තැම්බර් 2022 | අගෝස්තු 2023 | සැප්තැම්බර් 2023(අ) |
| සංචිත මුදල් | 1,378.6 | 1,407.3 | 1,244.0 | 6.4 | 1.5 | -9.8 |
| පටු මුදල් සැපයුම (M1) | 1,528.6 | 1,516.4 | 1,521.1 | 15.9 | -1.2 | -0.5 |
| පුළුල් මුදල් සැපයුම (M2) | 10,351.4 | 11,041.4 | 11,125.2 | 9.6 | 7.4 | 7.5 |
| ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b) | 12,051.5 | 12,697.9 | 12,805.7 | 14.9 | 5.9 | 6.3 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම්(ආ) | -1,892.8 | -611.5 | -560.2 | -162.1 | 70.0 | 70.4 |
| මුදල් අධිකාරීන් | -1,590.8 | -957.7 | -986.6 | -902.3 | 40.7 | 38.0 |
| වාණිජ බැංකු | -302.0 | 346.2 | 426.4 | 46.4 | 182.4 | 241.2 |
| දේශීය බැංකු ඒකක (DBUs) | -527.6 | -290.2 | -269.2 | -38.3 | 51.4 | 49.0 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 225.6 | 636.4 | 695.6 | 224.1 | 260.4 | 208.3 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ දේශීය වත්කම්(ආ) | 13,944.3 | 13,309.4 | 13,365.8 | 24.4 | -5.1 | -4.2 |
| රජයේ ණය ගැනීම් (ශුද්ධ) | 7,043.4 | 8,465.3 | 8,203.6 | 25.9 | 21.1 | 16.5 |
| මහ බැංකුව | 3,302.4 | 3,054.7 | 2,841.6 | 80.4 | -7.7 | -14.0 |
| වාණිජ බැංකු | 3,741.0 | 5,410.5 | 5,362.1 | -0.6 | 47.1 | 43.3 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 3,272.4 | 5,141.0 | 5,118.5 | -3.0 | 60.0 | 56.4 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 468.5 | 269.5 | 243.6 | 20.2 | -42.2 | -48.0 |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය | 1,703.0 | 1,091.0 | 1,098.8 | 51.6 | -35.8 | -35.5 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 1,581.0 | 1,033.9 | 1,041.2 | 143.0 | -34.5 | -34.2 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 122.0 | 57.1 | 57.6 | -74.2 | -53.0 | -52.8 |
| පෞද්ගලික අංශයට දෙන ලද ණය | 7,576.9 | 7,098.3 | 7,168.1 | 11.0 | -6.8 | -5.4 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 6,864.0 | 6,587.8 | 6,663.6 | 8.4 | -4.4 | -2.9 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 712.9 | 510.5 | 504.4 | 45.3 | -29.8 | -29.3 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | -2,379.0 | -3,345.2 | -3,104.6 | -2.0 | -46.6 | -30.5 |





## 2.3 සංචිත මුදල්හි සතිපතා වෙනස

| | 2023-10-26 | 2023-11-02 | වෙනස |
|---|---|---|---|
| සංචිත මුදල් (රුපියල් මිලියන) | 1,430,606.64 | 1,463,342.44 | 32,735.80 |




## 2.4 මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් (දෛනික)

| ඒක්ෂණ මුදල් වෙළඳපොළ | 2023-10-30 | 2023-10-31 | 2023-11-01 | 2023-11-02 | 2023-11-03 |
|---|---|---|---|---|---|
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 10.28 | 10.29 | 10.26 | 10.24 | 10.30 |
| දළ වටිනාකම (රුපියල් බිලියන) | 15.75 | 6.70 | 14.55 | 15.83 | 6.40 |

| වෙළඳපොළ ප්‍රතිමිලදී ගැනුම් | 2023-10-30 | 2023-10-31 | 2023-11-01 | 2023-11-02 | 2023-11-03 |
|---|---|---|---|---|---|
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 10.89 | 10.84 | 11.00 | 11.00 | 10.67 |
| දළ වටිනාකම (රුපියල් බිලියන) | 17.35 | 24.30 | 10.05 | 11.33 | 30.78 |

## 2.5 ශ්‍රී ලංකා මහ බැංකුව සතු සුරැකුම්පත් ගොනුව

| | 2023-10-30 | 2023-10-31 | 2023-11-01 | 2023-11-02 | 2023-11-03 |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - මුහුණත අගය (රුපියල් බිලියන) | 2,839 | 2,839 | 2,839 | 2,839 | 2,839 |
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - පොත් අගය (රුපියල් බිලියන) | 1,728 | 1,729 | 1,727 | 1,726 | 1,721 |

(අ) තාවකාලික
(ආ) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b) අදාළව

## 2.6 විවට වෙළඳ කටයුතු

| අයිතමය | 2023 ඔක්. 30 | 2023 ඔක්. 31 | 2023 නොවැ. 01 | 2023 නොවැ. 02 | 2023 නොවැ. 03 |
|---|---|---|---|---|---|
| **කෙටි කාලීන වෙන්දේසි** | | | | | |
| පිරිනමන ලද ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | 30.00 | 25.00 | 40.00 | 50.00 | 40.00 |
| කාල සීමාව (දින ගණන) | 1 | 1 | 1 | 1 | 3 |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | 15.85 | 24.90 | 35.33 | 35.28 | 14.82 |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | 15.85 | 24.90 | 35.33 | 35.28 | 14.82 |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | 10.04 | 10.04 | 10.04 | 10.04 | 10.05 |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | 10.55 | 10.70 | 10.50 | 10.17 | 10.60 |
| බරිත සාමාන්‍ය එලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | 10.10 | 10.15 | 10.10 | 10.08 | 10.16 |
| **ස්ථිර පදනම මත වෙන්දේසි** | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම (රු. බිලියන) | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනුම් (රු. බිලියන) | | | | | |
| පියවීමේ දිනය | | | | | |
| පරිණත වන දිනය | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය එලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **දිගු කාලීන වෙන්දේසි** | | | | | |
| පිළිගත් ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පියවීමේ දිනය | | | | | |
| පරිණත වන දිනය | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය එලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **ද්‍රවශීලතා පහසුකම් වෙන්දේසි** | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පියවීමේ දිනය | | | | | |
| පරිණත වන දිනය | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය එලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **නිත්‍ය පහසුකම** | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම (රු. බිලියන) | 35.100 | 63.752 | 84.600 | 10.960 | 218.782 |
| නිත්‍ය ණය පහසුකම (රු. බිලියන) | 26.875 | 28.285 | 24.348 | 23.689 | 17.404 |
| | | | | | |
| **සමස්ත වෙළඳපොළ එක් දින ද්‍රවශීලතාව (රු. බිලියන)** | **(7.625)** | **10.567** | **24.922** | **(48.004)** | **186.558** |
| **සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව (රු. බිලියන)[(අ)]** | **(158.675)** | **(140.483)** | **(126.128)** | **(199.054)** | **35.508** |

(අ) සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාවෙන් නිරූපණය වන්නේ කෙටි කාලීන සහ දිගු කාලීන නොපියවූ ප්‍රතිමිලදීගැනුම් /ප්‍රතිවිකුණුම් ගණුදෙනු ගළපන ලද එක් දින ද්‍රවශීලතාවයි .

## 2.7 ණය කාඩ්පත් සහ වාණිජ පත්‍රිකා නිකුතු

### 2.7.1 ණය කාඩ්පත්[(අ)]


| | 2022 දෙසැම්බර් | 2023 ජූලි | 2023 අගෝස්තු [(ආ)] |
|---|---|---|---|
| මුළු සක්‍රීය කාඩ්පත් ගණන | 1,952,991 | 1,919,771 | 1,917,336 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 13,028 | 11,437 | 11,316 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 1,939,963 | 1,908,334 | 1,906,020 |
| නොපියවූ ශේෂය (රු. මිලියන) | 143,098 | 143,035 | 144,470 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 37,328 | 34,912 | 34,965 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 105,770 | 108,123 | 109,505 |

### 2.7.2 වාණිජ පත්‍රිකා නිකුතු[(ඇ)]


| | 2022 දෙසැම්බර් | 2023 ජූලි | 2023 අගෝස්තු[(ආ)] |
|---|---|---|---|
| සමස්ත නිකුතුව (සමුච්චිත) - රු. බිලියන [(ඈ)] | 2.0 | 0.5 | 0.5 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) - රු. බිලියන | 0.2 | 0.5 | 0.5 |

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද (ආ) තාවකාලික
(ඇ ) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සපයන ලද දත්ත මත පදනම්ව
(ඈ) වසරේ මේ දක්වා එකතුව

**වාණිජ පත්‍රිකා නිකුතු (සමුච්චිත)**





**ණය කාඩ්පත් - නොපියවූ ශේෂය**




## 2.9 කොටස් වෙළඳපොළ

| | 2022-11-04 | 2023-10-27 | 2023-11-03 |
|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) (ASPI) | 8,491.80 | 10,689.50 | 10,789.87 |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය (2004 = 1,000) (S&P SL20) | 2,585.43 | 3,015.37 | 3,031.28 |
| දෛනික පිරිවැටුම (රු. මිලියන) | 817.85 | 659.64 | 513.48 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | 3,756.50 | 4,305.43 | 4,337.93 |
| විදේශීය මිලදී ගැනීම් (රු. මිලියන) | 13.72 | 142.00 | 107.65 |
| විදේශීය විකිණුම් (රු. මිලියන) | 11.23 | 53.15 | 69.52 |
| ශුද්ධ විදේශ මිලදී ගැනීම් (රු. මිලියන) | 2.49 | 88.85 | 38.13 |

**කොටස් වෙළඳපොළ - මාසය අවසානයට**




# රාජ්‍ය මූල්‍ය අංශය

